**සබරගමුව පළාත් සභාව -2023**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

සබරගමුව පළාත් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 12 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙත ද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්** | **නිර්දේශය** |
|---|---|---|---|
| | ------------------------ | ------------------------- | ------------ |
| (අ) | ආයෝජන පොළී ආදායමට අදාළ රු.3,001,541ක් වූ රඳවා ගැනීමේ බදු, පොළී ආදායමට බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. | ඉදිරි ගිණුම් නිවැරදිව සකස් කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතු ය. |
| (ආ) | පළාත් මාර්ග 594ක වූ කි.මී.2653ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. එහෙත්, 2023වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 තුළ පමණක් මාර්ග සඳහා රු.584,584,187ක මූලධන වියදමක් දරා තිබුණි. | ඉදිරියේදී ගිණුම්ගත කිරීමට හෝ හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් රු.41,723,295ක් අඩුවෙන් දක්වා තිබුණි. | එම දෝෂ නිවැරදි කිරීමට උපදෙස් දුන් බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් සභාවේ දායකත්වය සමග කොරියානු රජයේ සෙමාවුල් ගෝලීයකරණ පදනමෙන් ලද රු.314,992,689ක් හා එමගින් ජනිත වූ වත්කම්, එම ව්‍යාපෘතිය ආරම්භ කළ 2015 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වාම මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. එමෙන්ම, ශ්‍රී ලංකා ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල ද එම ගනුදෙනු ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේ දී ගිණුම්ගත කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කිරීමට සටහන් කරගෙන ඇති බව. | - එම - |
| (ඉ) | එකතුව රු.7,820,900ක් වූ සමාජ සේවා අංශයට අයත් උපකරණ හා රන් කරාබු ජෝඩු 24ක් ද, ළමා රැඳවුම් නිවාස 02කට අයත් ඉඩම් හා ගොඩනැගිලි ද ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි රජයේ තක්සේරුවට යොමු කර ඇත. සියලු වත්කම් ඉදිරියේදී ගිණුම්ගත කරන බව. | - එම - |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාව අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.5.1 ශීර්ෂය 800 - ආණ්ඩුකාරවර කාර්යාලය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලයේ ගිණුම් කටයුතු සඳහා රජයේ ගණකාධිකාරිවරයෙකු පත්කර 2012 සැප්තැම්බර් සිට මේ දක්වා රු.430,452 ක් ගෙවා තිබුණි. ඊට අමතරව, ගණකාධිකාරිවරයෙකුගේ කාර්යයන් ඉටු කිරීමට එම කාර්යාලයේ මුදල් සහකාර වෙත ද මාසිකව රු.1,000ක දීමනාවක් ගෙවා තිබුණි. | ගණකාධිකාරි තනතුරක් අනුමත වී නැති බැවින් අධීක්ෂණ ගණකාධිකාරීවරයෙකුගේ සේවය ලබා ගනී. මුදල් සහකාර විසින් එම තනතුරට අදාළ රාජකාරි ඉටුකරන බැවින් රු.1000ක දීමනාවක් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව ගෙවනු ලැබේ. | ගණකාධිකාරිවරයෙකුගේ කාර්යය මුදල් සහකාර විසින් ඉටු කරන බැවින් ගණකාධිකාරිවරයෙකු සඳහා ද වැටුප් ගෙවීම අවශ්‍ය නොවීම. |

**1.5.1.1 හදිසි අවස්ථා අරමුදල**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| | අරමුදල ස්ථාපිත කළ ප්‍රඥප්තිය අනුව, අනෙක් ප්‍රඥප්ති මඟින් තීරණය කරන මුදල් මෙම අරමුදලට බැර කළ යුතු වුවත්, අරමුදල් ආරම්භ කර වසර 24 ක් ඉකුත්ව ඇතත් මේ දක්වා කිසිදු මුදලක් අරමුදලට බැරකර නොතිබුණි. | අරමුදල්වල සීමිතභාවය හා හදිසි අවස්ථා උද්ගත නොවීම හේතුවෙන් අරමුදල් වෙන්කර නොමැති අතර 2025 ඇස්තමේන්තුවට යම් මුදල් ප්‍රමාණයක් වෙන් කිරීමට සටහන් කර ගතිමි. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**1.5.2 ශීර්ෂය 801 - පළාත් සභා ලේකම් කාර්යාලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | සබරගමුව පළාත් සභාව විසින් 2011 වර්ෂයේ සිට පළාත් සභාව විසුරුවන ලද 2017 වර්ෂය තෙක් සියලුම මන්ත්‍රීවරුවන්ටත්, පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු ආණ්ඩුකාරවරයා සහ සභාපතිවරයා සඳහාත් රක්ෂණ යෝජනා ක්‍රම 02ක් අමාත්‍ය මණ්ඩල තීරණය මත ක්‍රියාත්මක කර තිබුණි.<br>පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | එම යෝජනා ක්‍රම කිසිවකට ආණ්ඩුකාරවරයාගේ අනුමැතියක් නොතිබුණි. කෙසේ නමුත්, මෙම යෝජනා ක්‍රම අනුමත කළ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ආණ්ඩුකාරවරයාගේ අනුමැතියක් පිළිබඳ සඳහනක් නොතිබුණු බව සභා ලේකම්වරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි. | අමාත්‍ය මණ්ඩලයේ හා කාරක සභාවේ තීරණය අභිබවා කටයුතු කිරීමට හැකියාවක් නොමැති බව. | අදාළ වන නීතිරීති හා රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු ය. |
| (ii) | මෙම රක්ෂණ යෝජනා ක්‍රම මගින් ලබා දී තිබුණු රක්ෂණ ආවරණය 1988 අංක 37 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) පනතේ 02 වගන්තියට අනුකූල නොවූ බැවින් 2011 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වාර්ෂික වාරික ලෙස රු.53,895,838ක් පළාත් සභා අරමුදලින් වැඩිපුර ගෙවා තිබුණි. | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් හඳුන්වා දුන් මෙම යෝජනා ක්‍රමවලින් වැඩිපුර ගෙවීමක් සිදු වී නොමැති බව | පනතට අනුකූල විය යුතු ය. |

**1.5.3 ශීර්ෂය 804 – පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | සබරගමුව පළාත් සභා සංකීර්ණය පවතින රු.9,280,000ක් වූ ඉඩම සඳහා අවශ්‍ය අනුමැතිය ලැබී තිබුණ ද, 2024 අප්‍රේල් වන විටත් එය පවරා ගෙන නොතිබුණි. | ඉඩම පවරා දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත දන්වා ඇති බව. | ඉඩම පළාත් සභාව වෙත පවරා ගත යුතු වේ. |
| (ආ) | පළාත් සභා සංකීර්ණයේ අභ්‍යන්තර දූරකථන පද්ධතිය 2019 වර්ෂයේ අලුත්වැඩියා කළ ද, යථා තත්ත්වයට පත් නොවීම නිසා ඒ වෙනුවෙන් වැය කළ රු.1,609,055ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. මේ නිසා නව දූරකථන පද්ධතියක් වෙනුවෙන් ලංකා ටෙලිකොම් ආයතන විසින් රු.4,566,578ක ඇස්තමේන්තුවක් 2022 වර්ෂයේ ඉදිරිපත් කර තිබුණි. ඊට තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලැබී තිබුණ ද, ප්‍රසම්පාදන කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. මේ නිසා වර්ෂ 05ක් ගත වී තිබියදීත් අභ්‍යන්තර දූරකථන පද්ධතිය සක්‍රීය කිරීමට මේ දක්වා නොහැකි වී තිබුණි. | නිලධාරීන්ගේ ජංගම දූරකථන රාජකාරි සඳහා ද භාවිතා කරන බැවින් අභ්‍යන්තර දූරකථන පද්ධතියක අවශ්‍යතාවක් නොමැති බව. | ස්ථාවර දූරකථන වියදම අධික බැවින් අභ්‍යන්තර දූරකථන පද්ධතිය ස්ථාපිත කළ යුතු ය. |

**1.5.4 ශීර්ෂය 805- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | අංක 14/2022 හා 2022 ජුනි 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ දේශීය හා විදේශීය නිවාඩු ලබාගත් නිලධාරීන් 38 දෙනෙකු 2024 මාර්තු වන විටත් විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවා නොතිබුණි. | පළාත් සභාවේ ආයතන ප්‍රධානීන් වෙත ලිපි මඟින් දන්වා ඇති බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු ය. |
| (ආ) | අත්‍යවශ්‍ය තනතුරු වූ ගණකාධිකාරි හා තාක්ෂණික සේවා සඳහා 2023 වර්ෂය අවසානයට පිළිවෙලින් නිලධාරීන් 16 ක් සහ 157 ක පුරප්පාඩුවක් පැවතුණි. | ගණකාධිකාරි තනතුරු 02 ක් බඳවා ගැනීමට හා විශ්‍රාමික නිලධාරීන් 20 ක් තාක්ෂණ සේවය සඳහා යොදවා ගැනීමට අනුමැතිය ලැබී ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු ය. |

**1.5.5 ශීර්ෂය 806- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන)**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| රු. 14,694,555 ක විදේශාධාර වැය කරමින් පළාත වෙනුවෙන් 2019 වර්ෂයේ සිට ඉදිරියට පස් අවුරුදු සැලැස්මක් සකස් කර තිබුණ ද, එහි ප්‍රගතිය පරීක්ෂාකර නොතිබුණි. එම සැලැසුමේ ඉටු නොවූ ඉලක්ක, ඉදිරි සැලැසුම්වලට ඇතුළත් කිරීම පිළිබඳව ද අවධානය යොමු කර නොතිබුණි. | එම සැලැසුමේ වූ ළඟාකර නොගත් ඉලක්ක ඉදිරි පළාත් සංවර්ධන සැලසුම්වලට ඇතුළත් කර ගන්නා බව. | සැලැස්මේ ප්‍රගතිය පරීක්ෂා කර ඉදිරි සැලසුම් පිළියෙල කළ යුතු ය. |

**1.5.6 ශීර්ෂය 808 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යාලය සතු අක්කර 10ක පමණ වපසරියක් සහිත ඉඩම් කැබලි 24 ක ඉදිකළ නිල නිවාස 40 ක් පැවති අතර ඉන් ඉඩම් කැබලි 20ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බව . | ඉඩම්වල අයිතිය පවරා ගත යුතු ය. |
| (ආ) | 2023 වර්ෂයේදී රු.43,507,900 ක් ගෙවා තාර බැරල් 970 ක් සහ කෝලාස් බැරල් 120 ක් මිල දී ගෙන තිබුණි. ඒ වන විට ගබඩා සතුව ප්‍රමාණවත් තොග පැවැතිය දී සහ විධායක ඉංජිනේරු කාර්යාල අතර තොග හුවමාරු කිරීමේ හැකියාව තිබියදී නැවත තොග මිල දී ගැනීම හේතුවෙන් මාස 07 ක කාලයක සිට රු.36,188,610ක තාර හා කෝලාස් බැරල් 904ක් අතිරික්ත තොග ලෙස ගබඩාවල රඳවා තිබුණි. | නොවැළැක්විය හැකි හේතු නිසා භාවිතා කිරීමට සැලසුම් කළ කෝලාස් ප්‍රමාණය වැය නොවුණි. 2024 වසරේ භාවිතා කරන ලෙසට උපදෙස් දී ඇති බව. | අවශ්‍යතාව හඳුනාගෙන මිල දී ගැනීම් සිදුකළ යුතු ය. |

**1.5.7 ශීර්ෂය 809 - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ හිඟ ආදායම සියයට 58 කින් වැඩි වී තිබුණි. | ගෙවීම් තොරතුරු නොපමාව ලැබෙන්නේ නම්, හිඟ බදු මීට වඩා බෙහෙවින් අඩුවන බව. | හිඟ ආදායම් අය කළ යුතු ය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට පැවැති රු.90,769,688ක් වූ හිඟ ආදායමෙන් රු.7,554,095ක් වසර 10ත් 22ත් අතර ද, රු.2,487,429ක් වසර 05ත් 10ත් අතර ද රු.80,728,164ක් වසර 01ත් 05ත් අතර ද පැවැතිණි. මේ වෙනුවෙන් නීතිමය පියවර ගෙන 2023 දෙසැම්බර් 31 දිනට අවසන් නොවූ නඩු 174ක් පැවැතිණි. | පිළිගනිමි. හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නොතාරිස්වරයෙකු විසින් 2016 හා 2017 වර්ෂවල දී ලියාපදිංචි කළ ඔප්පු 139ක් වෙනුවෙන් රු.2,261,380ක මුද්දර ගාස්තු ගෙවා නොතිබුණි. එහෙත්, දඩ මුදල් ලෙස හඳුනාගත් රු. 710,600 කින් රු. 532,950 ක් කපා හැරීමට පළාත් ආදායම් කොමසාරිස්වරයා කටයුතු කර තිබුණි. | ඔහුට එරෙහිව නඩු පවරා ඇත. හිඟ අයකර ගැනීමට අඛණ්ඩව කටයුතු කරමින් පවතී. කොමසාරිස්වරයාට පවතින බලතල මත දඩ මුදලින් කොටසක් කපා හැර ඇති බව. | හිඟ ආදායම් අය කළ යුතුය.රැස් කළ ආදායම නොගෙවා සිටීම මූල්‍ය වංචාවක් බැවින් දඩ මුදල් කපාහැරීම සිදු නොකළ යුතු ය. |

**1.5.8 ශීර්ෂය 810- නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුභ සාධන, පරිසර, ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු පළාත් අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | පුස්සැල්ල ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකය ඉදි කිරීම් 2022 පෙබරවාරි නිමකර තිබුණ ද, භාවිතයටගත හැකිවන පරිදි සකස් නොකිරීම නිසා වැය කළ රු. 3,811,135 ක් මේ දක්වා ඵලදායී වී නොතිබුණි. | ඉදිරියේදී ලැබෙන ප්‍රතිපාදන මත ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීමට හැකියාව ඇති බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු ය. |
| (ආ) | ඇහැලියගොඩ මූලික රෝහලේ රියදුරු විවේක කාමරය සහිත ගිලන්රථ ගරාජය භාවිතයටගත හැකි පරිදි නිමකර නොතිබිය දී අන්‍යෝන්‍ය එකඟතාව මත ගිවිසුම අවලංගු කිරිම නිසා ඒ වෙනුවෙන් දරන ලද රු.4,098,180 ක් නිෂ්ඵල වියදමක් වි තිබුණි. | ගොඩනැගිල්ලේ කොටසක වැඩ අවසන් කර අන්‍යෝන්‍ය එකඟතාව මත ගිවිසුම අවසන් කර ඇත. තව ද මෙහි ඉතිරි ඉදි කිරීම් ඉදිරි සැලැස්මට ඇතුළත් කර සිදු කරන බව. | - එම - |
| (ඇ) | 2023 වර්ෂයේදී ඇස්තමේන්තුගත වටිනාකම රු.165,298,000ක් වූ ඉදිකිරීම් කර්මාන්ත 32ක් ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ හා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත ලබා දී තිබුණි. | මෙම කර්මාන්ත සියල්ලම ප්‍රදානය කර ඇත්තේ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය හා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | ප්‍රධාන ලේකම්ගේ උපදෙස් පරිදි පළාත් දෙපාර්තමේන්තුවක උපරිම ප්‍රසම්පාදන සීමාව රුපියල් මිලියන 02ක් වුවද, ඊට පටහැනිව, රුපියල් මිලියන 05 ඉක්මවූ රු.543,621,184ක ප්‍රසම්පාදන 40ක් සෞඛ්‍ය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මගින් සිදුකර ඒ සඳහා ආවරණ අනුමැතිය හා අදාළ මිල දී ගැනීම් ප්‍රධාන අමාත්‍යාංශ මගින් සිදුකර තිබුණි. | සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන සීමාව ඉක්මවීම නිසා ප්‍රධාන අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. වර්තමානයේදී සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට රු.මිලියන 5 දක්වා සීමාව ලැබී ඇති බැවින් ඉදිරියේදී ගැටළුවක් ඇති නොවන බව. | නීතිරීති රෙගුලාසි අනුව කටයුතු කළ යුතු ය. |

### 1.5.8.1 සබරගමුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** | | |
| (i) | තොග ලේඛන අනුව 2023 දෙසැම්බර් 31 දිනට මුද්‍රණාල තොගයේ අගයට වඩා රු.9,155,451 ක් වැඩියෙන් එදිනට එම තොගය මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි. | තොග සමීක්ෂණය සිදු කිරීමට නොහැකි වූ බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස්කළ යුතු ය. |
| (ii) | සිවිල් අංශයේ ප්‍රගති වාර්තාව අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ව්‍යාපෘති 125 ක කළ වැඩ වටිනාකම රු.57,187,500 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | - එම - |
| (iii) | ආදායම් ප්‍රකාශය අනුව ආදායම් කාණ්ඩ 08ක ශේෂ හා ඒ ඒ අංශවල ආදායම් වාර්තා අනුව එම ශේෂ අතර රු.4,563,201 ක වෙනසක් පැවැතිණි. | ජ’නල් සටහන් මඟින් ඉදිරියේදී ගැලපුම් කරන බව. | - එම - |
| (iv) | ණයගැති උපලේඛනය අනුව ණයගැති ශේෂයට වඩා රු. 5,209,100 ක් වැඩියෙන් එම ශේෂය මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි. | සත්‍ය ණයගැති ශේෂය රු.60,868,675 ක් විය යුතු බව. | - එම - |
| (v) | රු. 26,714,087 ක් වූ වත්කම් අයිතම 03ක් සඳහා උපලේඛන හෝ සමීක්ෂණ වාර්තා නොලැබුණි. | මූලාශ්‍ර තොරතුරු නැවත පරීක්ෂා කර නිවැරදි කරන බව. | අවශ්‍ය සාක්ෂි ලබාදිය යුතු ය. |
| (ආ) | **මෙහෙයුම් සමාලෝචනය** | | |
| (i) | 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වැඩ අවසන් කළ කර්මාන්ත 06ක් වෙනුවෙන් රු.13,919,162 ක් පළාත් සභාව වෙත ගෙවා නොතිබුණි. | සිවිල් කර්මාන්තවල ලාභයෙන් සියයට 50ක් මෙම නොපියවූ අත්තිකාරම් පියවීම සඳහා අමාත්‍යාංශයෙන් අවකරණය කර ගන්නා බව. | නොපියවූ අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු ය. |
| (ii) | වැඩ නිම කිරීම නිසා රු. 2,168,803ක් වූ ඇප තැන්පතු උපකොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලුම්කර තිබුණද, අධිකාරියේ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් එම මුදල් පියවා නොතිබුණි. | මුදල් ලැබෙන පරිදි ඉදිරියේදී ඇපකර නිදහස් කරමි. | ඇප තැන්පතු කඩිනමින් නිදහස් කළ යුතු ය. |
| (iii) | වසර 05කට වඩා පැරණි රු.22,969,240ක් වූ ණයගැති ශේෂය, මුළු ණයගැතියන්ගෙන් සියයට 38 ක් විය. | මේ සඳහා “ බේරුම්කරුවෙකු” පත්කරන ලෙස ප්‍රධාන ලේකම්ගෙන් ඉල්ලීම් කර ඇත. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (iv) | ගෙවිය යුතු වැට් බදු වෙනුවෙන් 2023 වර්ෂයේ ලියන ලද රු.21,305,045ක චෙක්පත් 67 ක් 2024 අප්‍රේල් 30 දින දක්වාම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යවා නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ආදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාවක් සිදු කිරීමට නියමිත ය. එතෙක් මෙම චෙක්පත් නිකුත් නොකරන බව. | නීතිරීති රෙගුලාසි අනුව කටයුතු කළ යුතු ය. |

**(ඇ) ප්‍රසම්පාදනය**

| | | |
|---|---|---|
| එකතුව රු.43,181,037 ක් වූ කොන්ත්‍රාත් 15 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන තිබුණද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කිසිවක් අනුගමනය කර නොතිබුණි. | කෙටි කාලයක් තුළ ප්‍රසම්පාදන කමිටු ගණනාවක් කැඳවීමට සිදු වීමෙන් අදාළ ලිපිගොනු නිසි පරිදි නඩත්තු කළ නොහැකි විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි කටයුතු කළ යුතු ය. |

**1.5.8.2 පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------------ | ------------- |
| උද්‍යානය ස්ථාපිත කළ ප්‍රඥප්තිය අනුව සබරගමුව පළාතේ සාම්ප්‍රදායික ඉපැරණි ගමක තිබුණු අංග නිරූපනය කරන නිර්මිත, තේමා උද්‍යානයට එකතු කර නොතිබුණි. | යෝජිත ඉදිකිරීම් ආදායම් තත්ත්වය ස්ථාවර වූ පසුව නිර්මාණය කරන බව. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**1.5.8.3 සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------------ | ------------- |
| (අ) | **මෙහෙයුම් සමාලෝචනය** | | |
| (i) | සබරගමුව පළාත් සභාව සතු බස්නැවතුම් පොළවල් සහ එම ගොඩනැගිලි තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි. | අයිතිය තහවුරු කර ගෙන වටිනාකම් ගිණුම්ගත කරන බව. | අයිතිය ලබාගෙන වත්කම් ගිණුම්ගත කළ යුතු ය. |
| (ii) | 2023 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු ශේෂ පිරික්සුම හා ලෙජර ගිණුම් අතර රු.1,284,573 ක වෙනසක් පැවතුණි. | නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස්කළ යුතු ය. |
| (iii) | 2022 දෙසැම්බර් 21 දිනැති 8/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ III වගන්තිය අනුව ඉතිරිකරගත් නිවාඩු මත දීමනා ගෙවීමේදී පෙර වර්ෂයට අදාළ ලාභාංශ පළාත් සභා අරමුදලට ගෙවිය යුතු අතර පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයේ අරමුදල් ලබා නොගත යුතු ය. එහෙත්, එම කොන්දේසිවලට පටහැනිව, 2023 වර්ෂයේ එවැනි දීමනා ලෙස රු.1,569,210 ක් ගෙවා තිබුණි. | සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවක ව්‍යවස්ථා සංග්‍රහයේ 16 වගන්තිය අනුව ඉතිරි කරගත් නිවාඩු මත 1994 වර්ෂයේ සිට දීමනා ගෙවීමට කටයුතු කරන ලද බව. | මධ්‍යම රජයේ චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු ය. |
| (iv) | අපේක්ෂිත අලුත්වැඩියා වියදම රු.1,074,200ක් වූ, 2022 වර්ෂයේ අනතුරකට පත් කැබ් රථයක පරීක්ෂණ වාර්තා 2024 ජනවාරි වන විටත් ලබා දී නොතිබුණි. එමෙන්ම, රක්ෂණයෙන් ආවරණය නොවන රු.594,200ක හානිය සඳහා වගකිවයුතු පාර්ශව මේ දක්වා හඳුනාගෙන නොතිබුණි. | රු.594,000ක් පොත්වලින් කපා හැරීම සඳහා ප්‍රධාන ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කළ බව . | පරීක්ෂණ කඩිනමින් අවසන් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (v) | ආරක්ෂිත කැමරා සඳහා රු.3,441,110ක් වැය කර තිබුණ ද, 2018 වර්ෂයේ සිට එම කැමරා අක්‍රීයව පවතී. | වර්තමානයේදී එම කැමරා අක්‍රීයව පවතින බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු ය. |
| (vi) | රාජ්‍ය ආයතනවල සභාපතිවරුන්ට හිමි ලීටර් 150ක ඉන්ධන ප්‍රමාණය නියම කළ 2022 ජනවාරි 03 දිනැති PS/SP/Circu/01/02/2020 ජනාධිපති චක්‍රලේඛයට පටහැනිව ලබාගත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත 2023 නොවැම්බර් මස සිට සභාපතිවරයාට මසකට ඉන්ධන ලීටර් 300 ක් ලබා දී තිබුණි. | ගරු ආණ්ඩුකාරතුමන්ගේ විශේෂ අනුමැතිය මත මෙම අමතර ඉන්ධන ලබා දී ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| **(ආ)** | **අනුකූල නොවීම්**<br>සබරගමුව පළාතේ පළාත් සභාවේ 1994 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ, | | |
| (i) | 17 වගන්තිය අනුව මගී සේවා බලපත්‍රයක් පැවරිය නොහැකි වුවද, 2023 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් අවස්ථා 197ක දී රු. 19,485,000 ක් වටිනා මගී සේවා බලපත්‍ර වෙනත් පුද්ගලයින්ට පවරා තිබුණි. | බල රහිත හා ශුන්‍ය මාර්ග බලපත්‍ර පැවරුම් කිසිවක් සිදුකර නොමැති බව. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) | 25 වගන්තිය අනුව අධිකාරියේ කාර්ය මණ්ඩලයේ නොවන සභාපතිවරයා වෙනුවෙන් සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.535,905ක් ගෙවා තිබුණි. | අධිකාරියේ සේවය කරන සියලු දෙනාගේ ඉපැයීම් මත EPF හා ETF අය කළ යුතු බව කම්කරු දෙපාර්තමේන්තුව දන්වා ඇති බව. | - එම - |
| (iii) | 27(4) වගන්තිය අනුව පළාත් අධිකාරියේ වාර්ෂික ලාභයෙන් යම් ප්‍රතිශතයක් පළාත් සභා අරමුදලට ගෙවා නොතිබුණි. | ලාභාංශය ගෙවීම වෙනුවට ප්‍රධාන අමාත්‍යාංශයෙන් අධිකාරියට ගෙවිය යුතු මිලියන 14ක් පළාත් අරමුදලටම බැර කරන බව. | - එම - |
| (iv) | 30(2) වගන්තිය අනුව, සකස් කළ රීති පළාත් සභාවේ අනුමත කර ගැසට්පත්‍රයේ පළකරන තෙක් බලාත්මක නොවිය යුතු වුවද, අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත මගී සේවා බලපත්‍ර සඳහා ගාස්තු සහ මාර්ග පරීක්ෂක දඩ අයකර තිබුණි. | ඉදිරියේදී ගැසට් කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (v) | 09 හා 19 වගන්ති අනුව, මගී සේවා බලපත්‍ර නොමැති බස් රථ 192කින් රු.3,535,350 ක් බලපත්‍ර ගාස්තු හා අධිභාර ලෙස අයවිය යුතුව පැවැතිණි. | දඩ හා අධිභාර අය කරන බව . | - එම - |

**(ඇ) ආදායම් කළමනාකරණය**

| | | |
|---|---|---|
| බස් රථ 168 කින් වර්ෂ 03ක් පැරණි හිඟහිටි රු.913,852 ක දඩ මුදල් අයකර නොතිබුණි. එමෙන්ම, 2023 දෙසැම්බර් 31 දිනට බස් රථ 119 කින් රු.6,365,023ක ලොග් පත්‍ර ආදායමක් ද, බස් රථ 86කින් අන්තර් පළාත් පිවිසුම් ගාස්තු රු.1,132,050ක් ද අයවිය යුතුව පැවැතිණි. | දඩ හා අධිභාර අයකරගැනීමට කටයුතු කර ඇති බව සහ ලොග් පත්‍ර ගාස්තු 6,365,023ක් හා අන්තර් පළාත් පිවිසුම් ගාස්තු රු.3,132,050ක් තවදුරටත් හිඟහිටිව පවතී. | හිඟ මුදල් අප්‍රමාදව අයකළ යුතු ය. |

**(ඈ) මානව සම්පත් කළමනාකරණය**

| | | |
|---|---|---|
| අංක DMS/SG/0505 හා 2017 මැයි 29 දිනැති කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව තනතුරු සඳහා බඳවා ගැනීම, උපයන ආදායමින් වැටුප් ගෙවීමේ පදනම මත හා අනුමත බඳවාගැනීමේ පටිපාටියෙහි විධිවිධාන අනුව කළ යුතු බව දක්වා තිබුණ ද, එසේ කළ බවට සාක්ෂි නොතිබුණි. එමෙන්ම, ඊට පටහැනිව 2023 වර්ෂයේ අධිකාරියේ වැටුප් ගෙවීමට රු.26,000,000ක් ප්‍රධාන අමාත්‍යාංශයෙන් ලබා ගෙන තිබුණි. | 2023 පෙබරවාරි 23 දිනෙන් පසුව ආයතනයේ බඳවාගැනීම් හා උසස්කිරීමේ පටිපාටියට අනුව ඉදිරියට කටයුතු කරන බව හා මුදල් කොමිෂන් සභාවේ අවසරය මත වැටුප් ගෙවීමට ප්‍රධාන අමාත්‍යාංශයෙන් මුදල් ලබාගත් බව. | උපයන ආදායමින් වැටුප් ගෙවීම සිදු කළ යුතු ය. |

**1.5.8.4 සබරගමුව පළාතේ මධ්‍ය පුස්තකාල රංගශාලා අත්තිකාරම් ගිණුම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **අනුකූල නොවීම්** | | |
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ සබරගමුව පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය | | |
| (i) | මූල්‍ය රීති 369.4 ට අනනුකූලව, 2023 වර්ෂයේදී අත්තිකාරම් ගිණුමේ උපරිම වියදම් සීමාව රු.66,128කින් ඉක්මවා තිබුණි. | උපරිම වියදම් සීමාව වැඩිකර ගැනීම සඳහා භාණ්ඩාගාරයට දන්වා ඇති බව. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) | මූල්‍ය රීති 377.1 අනුව, අත්තිකාරම් ගිණුම ආරම්භයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා ප්‍රාග්ධන වත්කම්වල සමුච්චිත ක්ෂය රු.6,769,793ක් ක්ෂය සංචිත අරමුදලට බැර කර නොතිබුණි. | මෙම වර්ෂයේ සිට නියමිත පරිදි සංචිත අරමුදලට බැර කරන බව. | - එම - |
| (iii) | ප්‍රතිපාදන විසර්ජන ගිණුමේ 2023 දෙසැම්බර් 31 දිනට පැවැති රු.3,191,817 ක හර ශේෂය පියවීමට මූල්‍ය රීති 380.2 (ඇ) අනුව පරිපූරක ප්‍රතිපාදන ලබා ගෙන නොතිබුණි. | මෙම වර්ෂයේ නිවැරදි කරන බව. | - එම - |

**1.5.8.5 සබරගමුව පළාතේ නිවාස සංවර්ධන අරමුදල**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| අරමුදල 2017 වර්ෂයේ සිට අක්‍රීය වී තිබුණු අතර එම වර්ෂයේ සිට රු.292,959ක මුදලක් මේ දක්වාම අභාවිතව පවතී. | පළාත් සභාව විසුරුවීම නිසා භාරකාර මණ්ඩලයක් පත්කර නොමැති බැවින් අරමුදල සම්බන්ධයෙන් කටයුතු කළ නොහැකි බව. | අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටුකර ගත යුතු ය. |

**1.5.9 ශීර්ෂය - 811- පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කහවත්ත මූලික රෝහලට රෝගීන් ලියාපදිංචි කිරීමේ කටයුතු වෙනුවෙන් 2019 හා 2020 වර්ෂවල ලද ප්‍රින්ටර්ස් 05ක් හා ස්කැනර් යන්ත්‍ර 25 ක් අභාවිතව පැවැති අතර ඒ සඳහා ලද ලැප්ටොප් 25ක් එම කාර්යයන් සඳහා යොදා නොගෙන කාර්යය මණ්ඩලයේ නිලධාරීන්ට භාවිතා කිරීමට ලබා දී තිබුණි. | ඉදිරියේදී මෙම වැඩසටහන ආරම්භ කිරීමට නියමිතය. | වත්කම් අභාවිතව නොතැබිය යුතු අතර අපේක්ෂිත කාර්යයන් සඳහා යොදා ගතයුතු ය. |
| (ආ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනත අනුව පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවෙන් ලබාගත් ලියාපදිංචි සහතිකයක් නොමැතිව පෞද්ගලික වෛද්‍ය ආයතන පිහිටු වීමට හෝ පවත්වා ගෙන යාමට නොහැකි වේ. එහෙත්, 2023 දෙසැම්බර් 31 දිනට පළාත තුළ එවැනි ලියාපදිංචියක් නොමැති පෞද්ගලික වෛද්‍ය ආයතන 34ක් පවත්වාගෙන යනු ලබයි. | මේ පිළිබඳව ඉදිරි කටයුතු කිරීමේ බලධාරී ආයතනය කොළඹ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව බව. | පනත අනුව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | ගොඩකවෙල ප්‍රාදේශීය රෝහලේ රු.3,411,683ක් වැයකර 2021 වර්ෂයේ ඉදිකිරීම් නිම කළ එක්ස් කිරණ කාමරය ඉදි කළ දින සිට සහ 2019 වර්ෂයේදී වෙනත් රෝහල් වෙතින් ලද එක්ස් කිරණ යන්ත්‍ර 02 ක් හා 2021 වර්ෂයේ ලද ජෙනරේටරයක් ලද දින සිට නිශ්කාර්යව පවතී. | එක්ස් කිරණ කාමරය එක්ස් කිරණ යන්ත්‍රයක් ලැබෙන තෙක් නිශ්කාර්යව පවතී. | වත්කම් අභාවිතව නොතැබිය යුතු ය. |
| (ඈ) | ප්‍රාථමික සෞඛ්‍ය සේවා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ (PSSP) ප්‍රධාන අරමුණක් වූ ජාලගත සෞඛ්‍ය කළමනාකරණ පරිගණක තොරතුරු පද්ධතිය රෝහල් 04 ක ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වර්ෂ 2021-2023 අතර කාලය තුළ මිල දී ගත් එකතුව රු.9,256,591 ක් වූ Barcode Scanner 75 ක්, Barcode Printers 52 ක් සහ Servers 04 ක් 2024 පෙබරවාරි වන විටත් නිශ්කාර්යයව පවතී. | ඇඹිලිපිටිය මහ රෝහල මධ්‍යම රජයට පවරාගෙන ඇත. ඇහැලියගොඩ රෝහලෙහි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර රෝහල 02ක ක්‍රියාත්මක නොවන බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඉ) | රත්නපුර වෛද්‍ය සැපයුම් අංශය මඟින් ඇනවුමක් ඉදිරිපත් කර නොතිබියදී වෛද්‍ය සැපයීම් අංශය විසින් එවා තිබුණු රු.4,857,000ක Surgical gloves 60,000ක් භාරගෙන තිබුණි. | ගබඩා ඉඩකඩ නොමැති නිසා ප්‍රාදේශීය ගබඩාවලට බෙදා දෙන ලෙස කොළඹ වෛ.සැ.අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් උපදෙස් ලබා දුන් බව. | අවශ්‍ය ප්‍රමාණය පමණක් භාර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඊ) | සෞඛ්‍ය කාර්ය මණ්ඩල ව්‍යාප්තියේ දැඩි විෂමතා පවතින බව පහත කරුණු අනුව තහවුරු විය. | | |
| (i) | රෝහල් ඇතුළු සෞඛ්‍ය ආයතන 28ක වෛද්‍ය නිලධාරී තනතුරු 108 ක පුරප්පාඩු පවතින අතර ආයතන 26ක එම තනතුරු 50ක් අතිරික්ත වී තිබුණි. ආයතන 21ක හෙද නිලධාරී තනතුරු 154ක් පුරප්පාඩු වී තිබිය දී ආයතන 25ක එම තනතුරු 59ක් අතිරික්ත වී තිබුණි. | මෙම නිලධාරීන් අනුයුක්ත කිරීමේ බලය රේඛීය අමාත්‍යාංශය සතු බව. | පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු අතර අතිරික්ත හා පුරප්පාඩු ගලපා ගත යුතු ය. |
| (ii) | රත්නපුර දිස්ත්‍රික්කයේ මූලික රෝහල් 04ක විශේෂඥ වෛද්‍ය තනතුරු 10ක් පුරප්පාඩු වී පැවතිණි. එමෙන්ම, මාවනැල්ල මූලික රෝහලෙහි එම තනතුරු 02ක පුරප්පාඩුවක් ද කරවනැල්ල හා වරකාපොල මූලික රෝහල්වල එම තනතුරු 01 බැගින් අතිරික්තව ද පැවතුණි. | - එම - | - එම - |
| (iii) | රත්නපුර දිස්ත්‍රික්කයේ මූලික රෝහල් 05න් රෝහල් 04කම වෛද්‍ය අධිකාරී තනතුර පුරප්පාඩු වී පැවතුණි. | - එම - | - එම - |
| (iv) | පළාතේ A-කාණ්ඩයේ ප්‍රාදේශීය රෝහල්හි අනුමත හෙද නිලධාරී තනතුරු සංඛ්‍යාව 10-18 අතර පරාසයක පවතින නමුත් රඹුක්කන ප්‍රාදේශීය රෝහලේ අනුමත හෙද නිලධාරී තනතුරු සංඛ්‍යාව 42ක් වූ අසාමාන්‍ය අගයක් ගෙන තිබුණි. | හෙද නිලධාරි තනතුරු 29 ක් අනුමත කර ඇති බව. | සමාලෝචනයක් කර නිවැරදි කළ යුතු ය. |
| (v) | ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකය සඳහා වෛද්‍ය නිලධාරීන් අනුයුක්ත කිරීමේදී, දෛනික සාමාන්‍ය රෝගීන් සංඛ්‍යාව 03ක් වූ එක් ඒකකයකට වෛද්‍ය නිලධාරීන් 02දෙනෙකුද, එවැනි රෝගීන් 24 දෙනෙකු හා 86 දෙනෙකු සහිත ඒකක 02කට වෛද්‍ය නිලධාරීන් 03 දෙනෙකු බැගින් ද, දෛනික සාමාන්‍ය රෝගීන් 48 දෙනෙකු පැමිණෙන එක් ඒකකයකට වෛද්‍ය නිලධාරීන් 04 දෙනෙකු ද අනුයුක්ත කර තිබුණි. | මෙම නිලධාරීන් අනුයුක්ත කිරීමේ බලය රේඛීය අමාත්‍යාංශය සතු බව. | සමාලෝචනයක් සිදුකර නිවැරදි කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (vi) | 2024 අප්‍රේල් 30 විගණිත දින වන විට රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක 107 හිම හෙද තනතුරුද, ඒකක 85ක වෛද්‍ය නිලධාරී තනතුරු ද , ඒකක 68 ක ඖෂධ සංයෝජක තනතුර ද අනුමත කර නොතිබුණි. | කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාව ලැබී නොමැති බව. | තනතුරු අනුමත කරවා ගත යුතු ය. |
| (උ) | පළාත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයේ මූල්‍ය සීමාව වූ රුපියල් මිලියන 02 ක ඉක්මවා අවස්ථා 03 ක දී රු.10,316,412 ක මිල දී ගැනීම් සිදුකර තිබුණි. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් මෙලෙස මිල දී ගැනීම වැරදි බව පිළිගෙන තිබුණි. | ඒ සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | නීති, රීති හා රෙගුලාසි අනුව කටයුතු කළ යුතු ය. |
| (ඌ) | ඇහැළියගොඩ මූලික රෝහලේ රු. 836,138 ක් වූ DIFF LYSE Reagent බෝතල් 21 ක ඌනතාවක් සිදු වී වසර 02 ක කාලයක් ගත වී තිබුණ ද, රජයට සිදු වූ පාඩුව වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර නොතිබුණි. | මූලික විමර්ශන මණ්ඩලයේ තීරණය අනුව ඉදිරි කටයුතු කරන බව. | සිදු වූ පාඩුව වගකිව යුතු අයගෙන් අය කළ යුතු ය. |

**1.5.10 ශීර්ෂය - 812- පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයුර්වේද කොමසාරිස්ගේ උපදෙස් පරිදි රෝහල් භූමි තුළ ඔසු උයන් ආරම්භ කිරීමෙන් රෝහල්වල ඖෂධ අවශ්‍යතාව සපුරාගැනීමට හැකි වුවද, පනාවල, රක්වාන, ඇඹිලිපිටිය, වල්ගම සහ ආයුර්වේද දෙපාර්තමේන්තුව එම කාර්යය නිසි පරිදි ඉටුකර නොතිබුණි. | දැඩි සේවක හිගයක් පවතින බැවින් ඔසු උයන් යථා පරිදි ක්‍රියාත්මක නොවූ නමුත් වගාකළ හැකි ඖෂධ යම් මට්ටමකින් හෝ වගාකරන බව . | ඔසු වගාව දිරිමත් කළ යුතු ය. |
| (ආ) | ඇඹිලිපිටිය ආයුර්වේද රෝහල පවතින මහවැලි අධිකාරියට අයත් ඉඩම සහ අක්කර 06ක පමණ භූමියක පවතින රක්වාන රෝහලේ ඉඩම පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීමේ ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරන බව. | ඉඩම් අයිතිය පවරාගත යුතු ය. |
| (ඇ) | කෑගල්ල ආයුර්වේද රෝහල සතු 2020 වර්ෂයේ වැඩ නිම කළ රු.66,886,932ක් වූ ගෙවන වාට්ටු සහිත ගොඩනැගිල්ල 2024 ජනවාරි වන විටත් අභාවිතව පැවැතිණි. | අවශ්‍ය උපකරණ හා මානව සම්පත් ගැටලුව මත ගෙවන වාට්ටු ආරම්භ කිරීමට ප්‍රමාද වුවද, මෙම වසරේ ආරම්භ කරන බව . | වත්කම් අභාවිතව නොතැබිය යුතු ය. |
| (ඈ) | ඇඹිලිපිටිය ආයුර්වේද රෝහලේ 2023 අගෝස්තු මාසයේ ආරම්භ කළ ගෙවන වාට්ටු සංකීර්ණය ආරම්භයේ සිට මාස 04ක කාලය තුළ රෝගීන් දෙදෙනෙකු පමණක් ප්‍රතිකාර ගෙන තිබීමෙන් එම ගොඩනැගිල්ල හා උපකරණ වෙනුවෙන් වැය කළ රුපියල් මිලියන 86ක් ඵලදායි වියදමක් වී නොතිබුණි. | අය කරන මිළ ගණන් නිසා රෝගීන් ගේ පැමිණීම අඩු වන බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අනුමත කාර්ය මණ්ඩලයේ 633 දෙනෙකුගෙන් පුරප්පාඩු 201ක් හා 33 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. එමෙන්ම, අනුමත නොවූ තනතුරු 13 ක් සඳහා නිලධාරින් 124 දෙනෙකු පත්කර තිබුණි. | බඳවා ගැනීම් සිදු කිරීමට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු අතර අතිරික්ත හා පුරප්පාඩු ගලපා ගත යුතු ය. |
| (ඊ) | කාර්යභාර වෛද්‍ය නිලධාරී තනතුර සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්වීම් ලබා දිය යුතු වේ. එහෙත්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුදැනුමෙන් තොරව ආයුර්වේද කොමසාරිස්වරුන් විසින් වෛද්‍යවරු 12 දෙනෙකුට පත්වීම් ලබා දී තිබුණි. | මේ සඳහා විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණු අතර අනෙකුත් පළාත් සභාවල ක්‍රියා පිළිවෙල හා නාවින්න ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පිළිවෙල ද එක්ව සබරගමුව පළාත සඳහා පටිපාටියක් සැකසීමට කටයුතු කරන බව. | බඳවා ගැනීම් විධිමත්ව සිදු කළ යුතු ය. |

**1.5.10.1 පින්නවල පංචකර්ම ඒකකය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| පංචකර්ම ඒකකය පිහිටුවා ඇති ස්ථානය ඉහළ සංචාරක ආකර්ෂණයක් ඇති අලි අනාථාගාරය, සත්වෝද්‍යානය හා ඉපැරණිගම තේමා උද්‍යානය නැරඹීම සඳහා පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයින්ගේ නැරඹුම් ස්ථානයක් වුවද, ආයතනයේ දුර්වල නඩත්තුව, සේවක මණ්ඩලය ප්‍රමාණවත් නොවීම හා ප්‍රචාරයක් නොමැතිවීම හේතුවෙන් දිනකට දේශීය පුද්ගලයින් දෙදෙනෙකු සහ වසරකට විදේශීය සංචාරකයින් තිදෙනෙකු පමණක් ප්‍රතිකාර ලබාගෙන තිබුණි. | ආයතනය සම්බන්ධව ප්‍රචාරණ කටයුතු සිදුකරන ලදී. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සඳහා දැනට වෙබ් අඩවියක් නොමැති අතර ඉදිරියේදී ප්‍රතිපාදන වෙන් කිරීම තුළින් පංචකර්ම ඒකකය සඳහා විශේෂ වෙබ් අඩවියක් ඇති කිරීමට බලාපොරොත්තු වන බව. | ආයතනය පිහිටුවීමේ අරමුණ ඉටුකරගැනීම සඳහා කටයුතු කළ යුතු ය. |

**1.5.11 ශීර්ෂය -813 - පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමුපකාර සංවර්ධන අරමුදල මඟින් වර්ෂ 2000 - 2018 අතර කාලය තුළ දී සමුපකාර සමිති 12ක් වෙත ලබාදුන් ණයවලින් 2023 දෙසැම්බර් 31 දිනට රු. 11,383,326 ක ණය අයවිය යුතුව පැවතුණි. | හිඟ පොලී කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගෙන් අනුමැතිය ලබා ගැනීම, ණය මුදල පියවීමට කටයුතු කිරිම හා ණය අය වෙමින් පවතින බව. | ණය අයකර ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ය. |
| (ආ) | සමුපකාර සංවර්ධන අරමුදල, තීරක අරමුදල හා ඇවර අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශ අනුව බැංකු ශේෂය රු.58,647,672 ක් වූ අතර අරමුදල සතුව රු.124,930,851ක ස්ථාවර තැන්පතු | රීති සකස් කර ඇතත් පළාත් සභාව පිහිටුවා නොතිබීම හේතුවෙන් අනුමත කර ගැනීමට නොහැකි වී ඇති බව. | රීති අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

පැවැතිණි. මෙම අරමුදල් පරිපාලනය සඳහා සකස් කළ රීති අනුමත කර නොතිබුණි. අරමුදල්වල ආරම්භයේ සිට මේ දක්වා ගිණුම් සකස් කිරීමක් සිදුකර නොතිබුණු අතර මෙම ශේෂ පළාත් සභා අරමුදල් ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි.

**1.5.12 ශීර්ෂය - 814 - පළාත් පාලන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | විගණකාධිපතිවරයා විසින් වරකාපොල ප්‍රාදේශීය සභාව වෙත නිකුත් කළ රු.129,600 ක අධිභාරයට මේ වන විට වසර 03 ක් ගත වී ඇතත්, අභියාචනා තීරණය ලැබී නොමැති බැවින් අධිභාරය අයකර නොතිබුණි. | අභියාචනා තීරණය ලැබෙන තුරු මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට නොහැකි වී ඇති බව. | අභියාචනා තීරණය ලැබීම ප්‍රමාද වීම පිළිබඳව සොයා බැලිය යුතු ය. |
| (ආ) | ආයතන සංග්‍රහයේ xiv වැනි පරිච්ඡේදයේ 12.1 වගන්තියට පටහැනිව, එකම කාල පරිච්ඡේදයක් සඳහා රු.131,885ක පරිවර්තිත ගමන් වියදම් දීමනාවකට අමතරව සංයුක්ත දීමනා හා ඉන්ධන දීමනා ලෙස රු.598,555ක් ද පළාත් පාලන කොමසාරිස්වරයා වෙත ගෙවා තිබුණි. | පරිවර්තිත ගමන් වියදම්, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත, ප්‍රධාන ලේකම් විසින් නිකුත් කර ඇති අංක සී.එස්.07/04/01/01 හා 2019.10.24 දිනැති චක්‍රලේඛ උපදෙස් පරිදි ගෙවා ඇති බව. | නීති, රීති හා රෙගුලාසි අනුව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | 2023 වර්ෂය සඳහා ආදායම් ඒකරාශි කිරීමේ සැලැස්මක් සකස් කර නොතිබුණු අතර පළාත් පාලන ආයතන 17ක හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු ප්‍රතිශතයක පැවතුණි. | රත්නපුර සහ කෑගල්ල සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් දැනුවත් කර ඇති බව. | හිඟ ආදායම් අය කළ යුතු ය. |
| (ඈ) | අංක 33/2017 හා 2017 දෙසැම්බර් 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව, පළාත් රාජ්‍ය සේවයේ ක්ෂේත්‍ර නිලධර ගණයට පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු තනතුර ඇතුළත් නොවුණි. එමෙන්ම, පරිවර්තිත ගමන් වියදම් හිමි තනතුරක් ලෙස පළාත් සභාව ද මෙම තනතුර හඳුනාගෙන නොතිබුණි. එසේ වුවත්, වර්ෂ 2021-2023 කාලය සඳහා පළාත් පාලන ඉංජිනේරු වෙත පරිවර්තිත ගමන් වියදම් ලෙස රු.180,020 ක් ගෙවා තිබුණි. | පරිවර්තිත ගමන් වියදම්, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත, ප්‍රධාන ලේකම් විසින් නිකුත් කර ඇති අංක සී.එස්.07/04/01/01 හා 2019.10.24 දිනැති චක්‍රලේඛය පරිදි ගෙවා ඇති බව. | නීති, රීති හා රෙගුලාසි අනුව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු නොකළ අවස්ථා පහත පරිදි පැවතිණි.<br><br>(i) ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය සමග සම්බන්ධතා කිසිවක් පවත්වා නොතිබුණි.<br><br>(ii) කිසිදු පළාත් පාලන ආයතනයක් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත පද්ධතියක් පවත්වා නොතිබුණි.<br><br>(iii) පස් අවුරුදු සැලසුමක් සකස්කර නොතිබුණි. | විද්‍යාත්මක සැලසුම්කරණය හා විද්‍යාත්මක ඝන අපද්‍රව්‍ය කළමනාකරණ දැනුම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පළාත් පාලන ආයතනවලට එම සැලැස්ම සකස් කිරීම අපහසු වී ඇත. පළාත් පාලන අමාත්‍යාංශයෙන් අවශ්‍ය තාක්ෂණික සහය ලද පසු ඉදිරි කටයුතු අවසන් කරන බව | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ඊ) | පළාත් පාලන ආයතන 08 ක 2023 නොවැම්බර් වන විට අලෙවි කළ නොහැකිව පොහොර 6,001,815kg ක් ගබඩාවල රඳවා තිබුණි. මීට විසඳුමක් ලෙස කාබනික පොහොර සඳහා වෙළඳපොළක් ඇතිකර ගැනීමට තත්ත්ව සහතිකයක් ලබා ගැනීම සඳහා පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වීම කළ යුතු වුවත්, පළාත් පාලන ආයතන කිසිවක් පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී එම පොහොර අලෙවි කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචිය පිළිබඳ සියලු පළාත් පාලන ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇති බව. ඒ අනුව ප්‍රමාණවත් ලෙස කාබනික පොහොර නිෂ්පාදනය කරන පළාත් පාලන ආයතන කිහිපයක් පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචිය ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | තත්ත්ව සහතිකයක් ලබාගෙන කාබනික පොහොර අලෙවි කර ගැනීම සඳහා කටයුතු කළ යුතු ය. |

**1.5.13 ශීර්ෂය- 820- පළාත් මාර්ග සංවර්ධනය,ග්‍රාමීය යටිතල පහසුකම් , සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු පළාත් අමාත්‍යාංශය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්** | **නිර්දේශය** |
|---|---|---|
| සපයන ලද කෝලාස් තොගවලින් ලබා ගන්නා සාම්පල් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පරීක්ෂා කර ඒවා අනුමත තාක්ෂණික පිරිවිතරවලට අනුකූල නොවන බවට තහවුරු කර තිබුණි. එහෙත්, ඒ වෙනුවෙන් රු.5,319,900ක් වූ සම්පූර්ණ මුදලම සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. | අදාළ ඉංජිනේරුමය නිර්දේශමත බිල්පත සඳහා ගෙවීම් සිදු කළ බව. | නියමිත තාක්ෂණික පිරිවිතරවලට අනුකූලව මිල දී ගැනීම් සිදු කළ යුතු ය. |

**1.5.14 ශීර්ෂය 821- පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්ත්මේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සබරගමුව පළාත් ක්‍රීඩා ප්‍රඥප්තිය අනුව පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩල පිහිටුවීම, ක්‍රීඩා අරමුදල් ගිණුමක් පැවැත්වීම, ක්‍රීඩා සංගම් ලියාපදිංචිය, ක්‍රීඩා ශිෂ්‍යත්ව සහ ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම යන කාර්යයන් කිසිවක් ඉටුකර නොතිබුණි. | පළාත් සභාව විසුරුවා හැරීම නිසා ක්‍රීඩා අමාත්‍යවරයෙක් නොසිටි බැවින් ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කළ නොහැකි බව. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | 47 වන ජාතික මහා ක්‍රීඩා උළෙලේදී හා වර්ෂ 2020-2023 කාලය තුළ ජාත්‍යන්තර තරඟවල දී දක්ෂතා දැක්වූ ක්‍රීඩකයින් හා පුහුණුකරුවන් ඇගයීමට තිළිණ ප්‍රදානය කර තිබුණි. මේ සඳහා 100x4 සහය දිවීම (පිරිමි) තරඟය සඳහා ඉහළම දක්ෂතා දැක්වූ තරඟකරුවන් සහභාගි කරවීමට කණ්ඩායම් කළමනාකාරීත්වය කටයුතුකර නොතිබුණි. එහෙත් ක්‍රීඩකයින්ගේ දක්ෂතා ඇගැයීමේදී ජාතික මහා ක්‍රීඩා උළෙලේ පදක්කමක් ලබාගත හැකිව පැවති ක්‍රීඩා තරඟයකින් ජයග්‍රහණ ලබා ගැනීමට තිබුණු අවස්ථාව අහිමි වී තිබුණි. | මෙවැනි අවිධිමත් ක්‍රියා සිදුවීම පළාත් ක්‍රීඩාවේ සංවර්ධනයට ද එම දෙපාර්තමේන්තුවේ කීර්තිනාමයට ද අහිතකර බැවින් අමාත්‍යාංශ ලේකම් විසින් මේ සම්බන්ධව පරීක්ෂා කිරීමට මූලික විමර්ශන කමිටුවක් පත්කර ඇති බව . | ක්‍රීඩා තරඟ සඳහා සුදුසු තරඟකරුවන් සහභාගි කරවීමට කණ්ඩායම් කළමනාකාරීත්වය කටයුතු කළ යුතු ය. |

**1.5.15 ශීර්ෂය 830- සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත පළාත් අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රත්නපුර වඩු පාසල සඳහා 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ වර්ෂ 04 තුළ සිසුන් 04 දෙනෙකු බඳවාගෙන තිබූ අතර එම සිසුන් 04 දෙනාම පාඨමාලාව හැර ගොස් තිබුණි. තිබොල්කැටිය වඩු පාසල සඳහා වර්ෂ 2020 - 2023 අතර කාලය තුළ සිසුන් 11 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර ඉන් සිසුන් 04 දෙනෙකු පාඨමාලාව හැරගොස් තිබුණි. වඩු පාසල් සඳහා සිසුන් ආකර්ෂණය කර ගැනීම හා ඔවුන් රඳවා ගැනීම සඳහා ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. | සිසුන් පාඨමාලා සඳහා බඳවා ගැනීම් කිරිම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල නිපුණතා සංවර්ධන නිලධාරින් හරහා ලිඛිතව හා වාචිකව දැනුවත් කිරීම් කර ඇති බව. . | වඩු පාසල් සඳහා සිසුන් බඳවා ගැනීමටත්, ඔවුන් පාඨමාලාව අවසානය දක්වා රඳවා ගැනීමටත් සුදුසු වැඩ පිළිවෙලක් සකස් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රත්නපුර වඩු පාසල සඳහා රු.556,661ක නිෂ්පාදන ඇනවුම් 03 ක් පමණක් 2023 වර්ෂයේදී ලැබී තිබුණි. තිබොල්කැටිය වඩු පාසල සඳහා 2020,2021 හා 2023 වර්ෂවලදී රු. 112,890 ක ඇනවුම් 03 ක් පමණක් ලැබී තිබුණි. පේරකැටිය, අටවක්වල හා කැල්ල යන රජයේ වඩු පාසල්වල 2023 වර්ෂයේ කිසිදු නිෂ්පාදනයක් හෝ අලෙවියක් සිදු වී නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් වඩුපාසල් ක්‍රියාකාරි මට්ටමින් පවත්වා ගැනීමට සහ සිසුන් බඳවා ගැනීමට නිසි ක්‍රමවේදයක් හෝ සැලැස්මක් සකස්කර නොතිබුණි. | පළාත්සභා ආයතනවලට දැව උපකරණ ලබා ගැනීමේදී මෙම දෙපාර්තමේන්තුවට යොමු කරන ලෙස ඉල්ලීම් කර ලිපියක් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත්කර ඇති බව. | වඩුපාසල් ක්‍රියාකාරි මට්ටමින් පවත්වා ගැනීමට සහ සිසුන් බඳවා ගැනීමට සුදුසු වැඩ පිළිවෙලක් සකස් කළ යුතු ය. |
| (ඇ) | ඇහැළියගොඩ අත්සළු ආයතනය පවතින මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉඩම පවරාගෙන නොතිබුණි. | පවරා දෙන ලෙස ඉල්ලීම්කර ඇතත් පවරා දී නොමැති බව. | ඉඩම් අයිතිය පවරාගත යුතු ය. |
| (ඈ) | ජනසළු ආයතනවල සිටින පුහුණු කාර්මිකාවන් අවුරුදු 50ත් 89ත් අතර වයසේ පසු වුවද, නව කාර්මිකාවන් බඳවා ගැනීම සඳහා ප්‍රවර්ධන වැඩපිළිවෙලක් නොතිබුණි. මේ නිසා ඉදිරියේදී අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය පවත්වාගෙන යාමේ අවදානමක් පැවතිණි. | නව කාර්මිකාවන් බඳවා ගැනීම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා දැනුවත් කිරීමේ වැඩ සටහන් වලට සහභාගී වී දැනුවත් කිරීම් කර ඇති බව. | නව කාර්මිකාවන් බඳවා ගැනීම සඳහා ප්‍රවර්ධන වැඩපිළිවෙලක් සකස් කළ යුතු ය. |
| (ඉ) | කොන්ත්‍රාත්කරුවෙකුට හිමි රු.478,409ක් ඔහුට නොදී අත රඳවා ගැනීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ විසින් ලබාදුන් නිර්දේශවලට අමාත්‍යාංශයේ ගණකාධිකාරී, සැලසුම් අධ්‍යක්ෂ සහ මුදල් සහකාර නිසි සැලකිල්ලක් නොදක්වීම නිසා විධිමත් පරීක්ෂණයක් 2024 අප්‍රේල් වන විටත් සිදුකර නොතිබුණි. | ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | විධිමත් පරීක්ෂණයක් කඩිනමින් සිදු කළ යුතු ය. |

**1.5.15.1පළාත් සමාජ සේවා අරමුදල**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| අරමුදල ස්ථාපිත කළ ප්‍රඥප්තිය අනුව 1994 වර්ෂයේදී අරමුදල වෙනුවෙන් රෙගුලාසි පනවාගෙන තිබුණ ද, ඉන් අංක 04, 06,15 හා 24 දරන රෙගුලාසි ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සටහන් කරගත් බව. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**1.5.16 ශීර්ෂය 831- පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව, අවශ්‍ය පිරිවිතර පැහැදිලිව ලංසු ලේඛනවල නොදැක්වීමෙන් ඇස්තමේන්තු කළ අමුද්‍රව්‍යවලින් සියයට 81ක් එනම් රු.33,599,200ක් මිල දී ගත නොහැකි වී තිබුණි. | ඉදිරියේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කිරීමට අදාළ තාක්ෂණික කමිටු වෙත උපදෙස් දී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මිල දී ගැනීම් සිදු කළ යුතු ය. |

**1.5.16.1 කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙන්කිරීම් සිදු නොකිරීම නිසා ගෙවූ පාරිතෝෂික රු.639,996ක් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මුළු පාරිතෝෂික මුදලින් සියයට 25ක් වාර්ෂිකව වෙන් කර ඇති බව. | පාරිතෝෂික සඳහා වෙන්කිරීම් සිදු කළ යුතු ය. |
| (ආ) | විධිමත් අනුමැතියක් රහිත ව රු.26,328,586 ක ජ'නල් සටහන් 63 ක් යොදා තිබුණි. | මෙම සියලු සටහන් පිළිගෙන සභාපති හා අනෙකුත් නිළධාරීන් විසින් අත්සන් තබා ඇති බව. | ජ'නල් සටහන් සඳහා විධිමත් අනුමැතියක් තිබිය යුතු ය. |
| (ඇ) | බලවින්න පෙරනිම් කොන්ක්‍රීට් අංගනයට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ වර්ෂ 01 ට වැඩි රු. 2,997,330 ක ණය ශේෂ පැවැතිණි. | මෙම ණය අයකර ගැනීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන බව. | හිඟ ණය කඩිනමින් අය කළ යුතු ය. |
| (ඈ) | බලවින්න පෙරනිම් කොන්ක්‍රීට් අංගනය විසින් නිෂ්පාදනය කරන භාණ්ඩ සඳහා 2022 අප්‍රේල් මාසයේ පැවති අමුද්‍රව්‍ය මිල ගණන් පදනම් කර ගනිමින් ඒකක විකුණුම් මිල තීරණය කර තිබුණි. දැනට වර්ෂ 1½ ක් ගත වී තිබුණ ද, නැවත මිල සංශෝධනයක් සිදු නොකර පැරණි මිලට භාණ්ඩ අලෙවිකර තිබුණි. | 2024 ජුනි මස 01 දින සිට නිෂ්පාදනවල මිළ නැවත තීරණය කිරීමට තීරණය කර ඇති බව. | මිල සංශෝධනය අවස්ථාවෝචිතව සිදුකළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | බලවින්න පෙරනිමි කොන්ක්‍රීට් අංගනයේ නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා භාවිතා කර තිබුණු සිමෙන්ති මිටි 1½ ක කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය 2021 වර්ෂයේ සිට අක්‍රිය වී තිබුණු අතර 2022 ජනවාරි මාසයේ මිල දී ගෙන තිබූ රු. 960,000 ක් වටිනා හොපරය සහිත කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය ද අක්‍රිය වී වසරකට වැඩි කාලයක් ගත වී තිබුණි. | මෙම යන්ත්‍ර දෙක අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී. | සථාවර වත්කම් නිසිපරිදි නඩත්තු කළ යුතු ය. |

**1.5.16.2 පේෂ කර්මාන්ත වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | අනුකූල නොවීම්<br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් මූල්‍ය රීති සංග්‍රහය - 2008 | | |
| (i) | මූල්‍ය රීති 377.1 අනුව වර්ෂ 2011- 2023 දක්වා කාලයට අදාළ රු.45,010,863ක් ක්ෂය සංචිත අරමුදලට බැරකර නොතිබුණි. | අත්තිකාරම් ගිණුමේ මූල්‍ය තත්ත්වය යහපත් වූ පසු යැවීමට කටයුතු කරමි. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) | මූල්‍ය රීති 378.2 අනුව, වර්ෂ 2016- 2023 කාලයට අදාළ රු.27,484,016ක් වූ සමුච්චිත ශුද්ධ ලාභය, පළාත් සභා විවිධ ආදායම් ශීර්ෂයට බැරකර නොතිබුණි. | - එම - | - එම - |
| (iii) | මූල්‍ය රීති 380.2 (ඇ) අනුව 2021 වර්ෂයේ ලාභාලාභ ගිණුමේ පැවැති රු.2,448,102ක පාඩුව පියවීම සඳහා පරිපූරක ප්‍රතිපාදන ලබා ගැනීමට 2023 වර්ෂයේ දී ත් නොහැකි වී තිබුණි. | කාරක පාඩුව කපා හැරීම සඳහා ප්‍රතිපාදන ඉල්ලා ඇති අතර මේ දක්වා ඒ සඳහා ප්‍රතිපාදන ලබා දී නොමැති බව. | - එම - |

**1.5.16.3 කුඩා කර්මාන්ත වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | තෝරාගත් ලුහු ඉංජිනේරු මධ්‍යස්ථානවල හා වඩු පාසැල්වල පුහුණුව ලබන සිසුන් සඳහා NVQ සහතිකයක් ලබා දීමට තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව එකඟ වී තිබුණි. එහෙත්, එම සභාව මගින් පෙන්වා දී තිබුණු අඩුපාඩු නිවැරදි නොකිරීමෙන් පුහුණුවන සිසුන්ට පිළිගත් සහතිකයක් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | NVQ සුදුසුකම ලබා දීමට හැකිවන අයුරින් අඩුපාඩු සම්පූර්ණ කරගෙන යන බව. | නිර්ණායක සම්පූර්ණ කර අදාළ NVQ සහතිකය ලබා දීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සබරගමුව පළාත් මූල්‍ය රීතී සංග්‍රහය - 2008 හි මූල්‍ය රීති 377.1 පරිදි 2023 වර්ෂයට අදාළ ප්‍රාග්ධන වත්කම් ක්ෂය රු.1,431,146 ක් ක්ෂය සංචිත අරමුදලට බැරකර නොතිබුණි. | ක්ෂය වටිනාකම මෙම වසර තුළ ප්‍රේෂණය කරමි. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**1.5.17 ශීර්ෂය 832 - පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | පළාත තුළ දිවා සුරැකුම් මධ්‍යස්ථාන 98 ක් පැවතුණද, දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කර තිබුණේ මධ්‍යස්ථාන 17ක් පමණි. | දිවා සුරැකුම් මධ්‍යස්ථා ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම් ලැබෙන අතර පරීක්ෂා කර ලියාපදිංචි කරන බව. | මධ්‍යස්ථාන ලියාපදිංචිය සහ අධීක්ෂණය සිදු කළ යුතු ය. |
| (ආ) | 2021 වර්ෂයේ ලද රු.1,973,400ක් වූ ශ්‍රවණාධාර උපකරණ 143ක් සහ 2023 වර්ෂයේ මිල දී ගත් රු.5,561,100ක කිහිලිකරු 44ක්, කොමඩ් රෝද පුටු 98ක්, රෝද පුටු 04ක්, කොමඩ් පුටු 22 ක්, ඇවිදින රාමු 84ක්, අත්වාරු 63ක් හා වායු මෙට්ට 72ක් 2024 මාර්තු වන විටත් ගබඩාවේ අභාවිතව පැවැතිණි. | ඉල්ලීම් කරන ලද අයට තවදුරටත් අවශ්‍යතාව පවතීද යන්න තහවුරුකර ගැනීමෙන් පසු භාණ්ඩ නිකුත් කරන බව. | අවශ්‍ය අයට කඩිනමින් එම භාණ්ඩ ලබාදීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | ප්‍රාදේශීය කාර්යාල 02ක 2023 වර්ෂය සඳහා කුලිය රු.539,000 ක් පෞද්ගලික ආයතන වෙත ගෙවා තිබුණි. | වඩාත් සුදුසුම විකල්පය වශයෙන් මෙම ගොඩනැගිල්ල තෝරා ගෙන ඇති බව. | රජයේ ආයතනයක කාර්යාල පැවැත්වීමට උත්සාහ කළ යුතු ය. |

**1.5.18 ශීර්ෂය - 840- අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු පළාත් අමාත්‍යාංශය.**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | කෑ/දෙහි/යෝගම ප්‍රාථමික විද්‍යාලයේ ඇස්තමේන්තුගත පිරිවැය රු.7,618,337ක් වූ විද්‍යාගාරයක් ඉදිකිරීම අතරමග අත්හැර දැමීම නිසා විද්‍යාගාර උපකරණ පෙට්ටිවල අහුරා තබා ගැනීමට සිදු වී තිබුණි. | මෙම ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කොටස් මේ වර්ෂයේදී අවසන් කිරීමට සැලසුම් කර ඇති බව . | ඉදිකිරීමේ කටයුතු අවසන් කළ යුතු ය. |
| (ආ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) යටතේ ප්‍රාථමික අධ්‍යාපනයට අවශ්‍ය ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා වෙන් කළ ප්‍රතිපාදනවලින් රු.19,919,150 ක් වැයකර අධ්‍යාපන කාර්යාල සඳහා තොරතුරු තාක්ෂණික උපකරණ මිල දී ගෙන තිබුණි. ඉන් රු.4,794,375ක උපකරණ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රයෝජනයට ගෙන තිබුණි. | පරිපාලන කටයුතු සඳහා කලාප කාර්යාල,දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ විසින් කටයුතු කරනු ලබන බැවින් ඒ සඳහා එම උපකරණ මිලදී ගෙන ඇති බව. | නිශ්චිත කාර්යයන් සඳහා ලබාදෙන ප්‍රතිපාදන එම කාර්යය සඳහාම යොදා ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | කෑ/දෙහි/මාලිබොඩ දෙමළ විද්‍යාලයේ ඊ ශිල්පාගාරය රු.2,122,590 ක් ගෙවා 2022 අප්‍රේල් නිමකර තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එය අභාවිතව පැවතුණි. | මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට විදුහල්පතිවරුන් දැනුවත් කරන ලෙස කලාප අධ්‍යක්ෂවරුන් වෙත දන්වා ඇති බව. | ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | ඉකුත් වර්ෂ 03 තුළ දූෂණ වංචා පිළිබඳ ලද විනය පැමිණිලි 68 කින් පැමිණිලි 20ක් ලද දින සිට වර්ෂයකට වඩා කල්ගත වී තිබුණ ද, අවසන් කර නොතිබුණි. | අදාළ පැමිණිලි පරීක්ෂා කර වාර්තා ලබා දීම සඳහා ඒ ඒ කලාප කාර්යාල වෙත යොමු කර ඇති බව. | විනය පැමිණිලි අප්‍රමාදව අවසන් කළ යුතු ය. |
| (ඉ) | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 21.1 ඡේදයට පටහැනිව, කෑ/මාව/හිරිවඩුන්න මහා විද්‍යාලයේ පුස්තකාලයාධිපති සම්බන්ධ විමර්ශනය ආරම්භ කර වර්ෂ 03කට වඩා ගත වී තිබුණ ද, නිමකර නොතිබුණි. | ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා පැමිණිල්ල මෙහෙයවන නිලධාරී වෙත දන්වා ඇති බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**1.5.18.1 සබරගමුව පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | පෙර පාසල් ලියාපදිංචි කිරීම අධිකාරියේ ප්‍රධාන කාර්යයක් වුවද, පෙර පාසල් 1481 කින් 495ක ලියාපදිංචිය 2023 වර්ෂයට සිදුකර නොතිබුණි. | පෙර පාසල් සඳහා නිර්ණායක සම්පූරණ කිරීමෙන් අනතුරුව යාවත්කාලීන කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | ලියාපදිංචි නොකළ පෙර පාසල් සොයා බලා යාවත්කාලීන කළ යුතු ය. |
| (ආ) | යුනිසෙෆ් සංවිධානයේ අනුග්‍රහය සහිතව පෙර පාසල් දරුවන් සඳහා දිවා ආහාර ලබා දීමේ වැඩසටහන - 2023 | | |
| (i) | පෝෂණ උපකාර අවශ්‍ය පෙර පාසල් 161ක් තෝරා ගෙන තිබුණ ද, ඉන් පාසල් 33ක එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රමුඛතාව අනුව තෝරාගත් පාසල් කීපයක් සඳහා ඉදිරියේදී ආහාර ලබා දීමට තීරණය කර ඇති බව. | පෝෂණ උපකාර අවශ්‍ය පාසල් තෝරාගත යුතු ය. |
| (ii) | ආහාර ලබා දීම අධීක්ෂණයට පත් කළ කමිටුවෙන් ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු වී නොතිබුණි.එනම්, නියමිත වට්ටෝරුව අනුව ආහාර ලබා නොදුන් අවස්ථා පැවතුණි. ආහාර සැපයුම්කරුවන්ට ගෙවීම් ප්‍රමාද කිරීම, නියමිත වට්ටෝරුවට අනුව ආහාර ලබා දීමට හා ආහාරවල ගුණාත්මකභාවයට බලපා තිබුණි. | අදාළ නිලධාරීන් යොදවා අධීක්ෂණ කටයුතු සිදු කර ඇත. වට්ටෝරු පරීක්ෂා කර ගෙවීම් සිදුකර ඇති බව. | ලබාදෙන ආහාර පිළිබඳ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු කළ යුතු ය. |

**1.5.18.2** මෙනේරිපිටිය සහ අටළුගම අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| අටුළුගම සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය පිහිටි අක්කරයක ඉඩමේ වසර 20කට අධික කාලයක සිට පදිංචි වී සිටින අනවසරකරුවන් ඉවත් කර නොතිබුණි. | දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් වෙත පැවරුම් සහතික සකස් කරන ලෙස ඉල්ලා ඇති බව. | ඉඩම පවරාගෙන අනවසර පදිංචිකරුවන් ඉවත් කළ යුතු ය. |

**1.5.19 ශීර්ෂය 841-** පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව පැවැති රු.105,675,000 ක් වූ වාහන 23ක් සහ පළාත් අධ්‍යාපන කාර්යාල, ඉගැනුම් මධ්‍යස්ථාන හා පළාත් පාසල් පිහිටි ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු අගය ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |
| (ආ) | පාසැල් 02ක සිසුන් ගණන ඉක්මවා රු.16,736,960ක් වූ ලැප්ටොප් පරිගණක සහ මේස හා පුටු 20 බැගින් ලබා දී තිබුණි. | ලබා දී ඇති ලැප්ටෝප් පරිගණක උපරිම ලෙස භාවිතා කරන බව. | අතිරික්තය වෙනත් පාසැලකට ලබාදීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන - (TEDP) | | |
| (i) | මෙම ව්‍යාපෘතිය යටතේ සබරගමුව පළාතේ පාසැල් 06ක් සඳහා රු.මිලියන 279.9 ක් වූ තාක්ෂණ පීඨ ගොඩනැඟිලි 05ක් ඉදිකිරීම, රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 04/2016(II) අනුව ප්‍රාදේශීය ප්‍රමුඛතා හා CIDA ශ්‍රේණිගත ප්‍රමුඛතාව පදනම් කර ගනිමින් ලංසු කැඳවා තිබීම නිසා 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) අනුව සුදුසුකම් ලත් පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීමට අවස්ථාව අහිමි වී තිබුණි. | ඉදිරියේදී පුවත්පත් දැන්වීම් පළ කරන විට මෙම වගන්තිය ඉවත්කර ලංසුකැඳවීමට පියවර ගන්නා බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි ලංසු කැඳවීම සිදු කළ යුතු ය. |
| (ii) | ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු දීමනා රු.121,500 ක් වැඩිපුර ගෙවා තිබුණි. | උපදෙස් ලද පසුව අවශ්‍ය කටයුතු කරන බව. | වැඩිපුර ගෙවීම් ආපසු අය කළ යුතු ය. |
| (iii) | කෑ/ඉඹුලාන ශ්‍රී සේන මහා විද්‍යාලයේ තාක්ෂණ පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීමේදී ඇස්තමේන්තුගත ප්‍රමාණ ඉක්මවා රු.3,200,944ක් ගෙවා තිබුණි, එය ප්‍රතිශතයක් ලෙස සියයට 104- 4186 දක්වා පරාසයක විය. එමෙන්ම, වානේ කම්බි හා එක් වැඩ විෂයකට වැඩිපුර ගෙවූ රු.175,646ක් මේ දක්වාම අයකර නොතිබුණි. | මේ පිළිබඳ සොයා බලා ඉදිරියේදී කටයුතු කරන බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| (iv) | රක්වාන ශාන්ත ජෝන් දෙමළ විද්‍යාලයේ තෙමහල් තාක්ෂණ පීය ගොඩනැගිල්ල ඉදිකිරීමේදී ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු.265,187ක් ගෙවා තිබුණු අතර ගෙවීම් ප්‍රමාද වීම නිසා රු.1,870,947ක විශේෂිත ගාස්තුවක් ද කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලුම් කර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | බලංගොඩ හා කලවාන කලාප තුළ වූ පාසැල් 04ක පවතින නායයෑමේ අවදානම සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි . | නාය යෑම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතියෙන් විමසා ඇති බව. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු ය. |
| (ඉ) | පළාතේ වතු පාසැල් 160කින් පාසැල් 147 කම පාසැල් භූමිය පවරාගෙන නොතිබුණි. අනවසරකරුවන් අත්පත් කරගත් පාසැල් 10ක පැවැති පර්චර්ස් 02ත් පර්චර්ස් 100ත් අතර ඉඩම් සහ ගොඩනැගිලි 03 ක් නැවත අත්පත් කරගෙන නොතිබුණි. | මෙය තනිව විසඳිය හැකි ගැටලුවක් නොවන බැවින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට මැදිහත්වන ලෙස ඉල්ලීමක් කර ඇති බව. | ඉඩම් අයිතිය පවරා ගත යුතු ය. |
| (ඊ) | දුෂ්කර සේවයේ වූ විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට දීමනා ගෙවීම 2009 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණි. එහෙත්, විවිධ ව්‍යාපෘති යටතේ මූලධන සම්පත් හා විදුලිය ලබා දීම්, මාර්ග වැඩි දියුණු කිරීම් ආදී යටිතල පහසුකම් වර්ෂ 2009-2023 අතර කාලයේදී සිදුකර තිබුණි. එහෙත්, පසුකාලීනව එම පාසල්වල පැවැති දුෂ්කරතා පිළිබඳ සමාලෝචනයකින් තොරව වර්ෂ 13ක් අඛණ්ඩව එම දීමනා ගෙවා තිබුණි. 2023 වර්ෂයේදි පමණක් පළාත තුළ දුෂ්කර සහ අති දුෂ්කර දීමනා ලෙස රු.55,356,953ක් ගෙවා තිබුණි. | දුෂ්කර හා අති දුෂ්කර පාසල් වර්ගීකරණය ජාතික ප්‍රතිපත්තියකි. එබැවින් පෙන්වා දී ඇති කාරණය මාගේ පාලනයෙන් බැහැර වූවකි. | දුෂ්කර හා අති දුෂ්කර පාසල් පිළිබඳව සමාලෝචනයක් සිදු කළ යුතු ය. |
| (උ) | නොවිධිමත් අධ්‍යාපනය යටතේ බලංගොඩ අධ්‍යාපන කළාපය තුළ ඇඳුම් මැසීමේ පාඨමාලා 11ක් මධ්‍යස්ථාන 11 ක පවත්වාගෙන යන අතර ඉන් මධ්‍යස්ථාන 05ක පමණක් මහන මැෂින් 08 ක් පැවැති අතර අනෙකුත් මධ්‍යස්ථාන 06ක පුහුණුලාභීන්ට මහන මැෂින් නොතිබුණි. රූපලාවන්‍ය හා කේශාලංකරණය සහ පොල්කටු කැටයම් පුහුණු කිරීමේ පාඨමාලා පවත්වාගෙන ගොස් තිබුණ ද, එම මධ්‍යස්ථානවල භාවිතා කිරීම සඳහා කිසිදු උපකරණයක් රජයෙන් සපයා නොතිබුණි. පාඨමාලා 20ක් සඳහා ළමුන් 407 ක් සහභාගි වී තිබුණු අතර මේ සඳහා රු.888,000ක් 2023 වර්ෂයේ වැය කර තිබුණි. එහෙත්, එම පාඨමාලා අවසන් වී සහතික ලබාගත් සංඛ්‍යාව 258 දෙනෙකු විය.මාවනැල්ල කලාපයේ මධ්‍යස්ථාන 30ක කාර්මික පාඨමාලා පැවැත්වීමට සැලසුම්කර තිබුණ ද, මධ්‍යස්ථාන 09 ක පාඨමාලා පවත්වා නොතිබුණි. | මෙම පාඨමාලාවල පුහුණු කටයුතු සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය ඉල්ලුම්කර ඇතත් ඒ සඳහා ප්‍රතිපාදන නොලැබුණු බැවින් අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමට නොහැකි විය. පාඨමාලා ආරම්භ කරන අවස්ථාවේදී ඒ සඳහා පුහුණුලාභීන් විශාල පිරිසක් සහභාගී වූවත් මාස 06 අවසන් වන විට විවිධ හේතු මත පුහුණුලාභීන් සංඛ්‍යාවේ අඩුවීමක් ඇති බව. | නොවිධිමත් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම පිළිබඳව අවධානය යොමු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | ද්විතියික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) වෙනුවෙන් 2023 වර්ෂය සඳහා වෙන්කළ රු. මිලියන 20ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 10ක අග්‍රිම ලැබී තිබුණු අතර ඉන් රු.මිලියන 9.15 ක් වර්ෂය තුළ වැයකර තිබුණි. නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ. | | |
| (i) | 2023 වර්ෂය සඳහා සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විෂයය ප්‍රවර්ධනය වෙනුවෙන් රු.මිලියන 75.11 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද, අග්‍රිම නොලැබීම මත සියයට 88ක් හෙවත් රු.මිලියන 66.1 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | ලබාදුන් ප්‍රතිපාදනවලට සමාන අග්‍රිම ලබාදෙනු ලැබුයේ නම් මෙම මුදල ඉතිරි නොවන බව. | අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අග්‍රිම ලබා දිය යුතු ය. |
| (ii) | විෂය ප්‍රවර්ධනය සඳහා ගුරුභවතුන් 10499 දෙනෙකු සහ සිසුන් 13,312 දෙනෙකු පුහුණු කිරීමට සැලසුම් කළ ද, අග්‍රිම නොලැබීම මත වර්ෂය අවසාන වන විට පුහුණුව ලද ගුරුභවතුන් සංඛ්‍යාව 1728 ක් ද, සිසුන් සංඛ්‍යාව 8,869ක් ද විය. | ලද මුදල කලමනාකරණය කරමින් කටයුතු කර ඇත. | - එම - |
| (iii) | රු.මිලියන 6.87 වෙන්කර ගුරුවරුන් 2920ක් පුහුණු කිරිම අපේක්ෂා කර තිබුණ ද, අග්‍රිම නොලැබීම නිසා රු.මිලියන 0.45ක් වැයකර ගුරුවරුන් 163 දෙනෙකු පමණක් පුහුණුකර තිබුණි. | - එම - | - එම - |
| (එ) | ඇඹිලිපිටිය කළාපයේ හොඳ තත්ත්වයේ වූ විදුහල්පති, ගුරු සහ තනිකඩ නිල නිවාස 56ක් අතුරින් 28ක් 2023 ඔක්තෝබර් 31 දින දක්වාමත් අභාවිතව පැවතුණි. එම නිවාසවලින් ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය මඟින් ඉදිකළ තනිකඩ කාමර 11ක් සහිත නිල නිවාස 02ක් ද පැවතුණි. කෑගල්ල කලාපයේ ගුරු නිවාස 37ක් වර්ෂ කිහිපයක සිට ඉතා අබලන් තත්ත්වයේ පැවති අතර අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | කෑගල්ල කලාපයේ අබලන් තත්ත්වයේ නිල නිවාස අලුත් වැඩියා කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම මීට බලපා ඇත.අභාවිතව පවතින නිල නිවාස අවශ්‍ය පුද්ගලයන්ට ලබාදීමට ඉදිරියේදී කටයුතු කරන බව. | ගුරු නිවාස භාවිතයට ගැනීම, අළුත්වැඩියා කිරීම හෝ ඉවත් කිරීම පිළිබඳව සමීක්ෂණයක් පවත්වා සුදුසු පරිදි කටයුතු කළ යුතු ය. |
| (ඒ) | පාසල් සිසු තත්ත්ව කව සඳහා වූ උපදෙස් සංග්‍රහයට හා පළාත් රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ 2023 ඔක්තෝබර් 24 දිනැති ලිපියට පටහැනිව, බලංගොඩ හා දෙහිඕවිට කලාපවල විනිසුරුවරුන්ට රු.254,100ක් වැඩිපුර ගෙවා තිබුණි. | පළාත් අමාත්‍යාංශයෙන් මේ පිළිබඳ උපදෙස් ලද වහාම අවශ්‍ය කටයුතු කරන බව. | වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු අය කළ යුතු ය. |
| (ඔ) | පාසල් ළමුන් සඳහා දිවා ආහාරවේල ලබා දීමේ වැඩසටහන සඳහා 2023 වර්ෂය වෙනුවෙන් ලබාදුන් රු.මිලියන 1458ක ප්‍රතිපාදන 2023 දෙසැම්බර් 21 දිනට රුපියල් මිලියන 691ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. මෙම වැඩසටහන වෙනුවෙන් දත්ත පද්ධතියක් කලාප සතු නොවීය. ලෝක ආහාර වැඩසටහනට අමතරව සිංහ සමාජය, | පාසැල් පවත්වන දින ගණන අඩුවීම හා විවිධ ආයතනය විසින් ද්‍රව්‍ය ලබා දීම හේතුවෙන් මුදල් ඉතිරි වී ඇති බව. Save the children ආයතනය විසින් සපයන ආහාර ප්‍රමාණ පිළිබඳ | මෙම වැඩසටහන පිළිබඳ කලාප මට්ටමින් දත්ත පද්ධතියක් පවත්වා ගත යුතු අතර ප්‍රතිපාදන උපරිමව උපයෝජනය සඳහා අවධානය යොමු කළ |

| | | | |
|---|---|---|---|
| | Save the children, Rice up Sri Lanka හා ස්වේච්ඡා කණ්ඩායම් මඟින් ද මෙම පාසල් සඳහා ආහාර ලබා දේ. එහෙත්, පාසල් වෙත ලද ආහාර ද්‍රව්‍ය ප්‍රමාණ, සැපයුම්කරු වෙත නිකුත් කළ ප්‍රමාණ, හානි වූ තොග, ගබඩාවේ ඉතිරි තොග ආදී පිළිබඳ කිසිදු තොරතුරක් කලාප කාර්යාල සතුව නොතිබුණි. | තොරතුරු කලාප කාර්යාල වෙත දැනුම්දීමේ අඩුපාඩුවක් පැවතුණි. නිසි පරිදි වාර්තා තබන ලෙස පාසල් දැනුවත් කර ඇති බව. | යුතු ය. |
| (ඔ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 49 ක ඌනතාවක් පැවති අතර, ද්විතීයික හා ප්‍රාථමික මට්ටමේ තනතුරු පිළිවෙලින් 2047ක් හා 28 ක් අතිරික්තව පැවතුණි. | මේ සම්බන්ධයෙන් පළාත් ප්‍රධාන ලේකම් වෙත වාර්තා කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර අතිරික්ත කාර්ය මණ්ඩල සුදුසු පරිදි අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ක) | පළාත තුළ අනුමත ගුරු කාර්ය මණ්ඩලය 24,401 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 20,423 ක් වූයෙන් ඌනතාව 3978 ක් විය. පළාතේ සියලුම කලාපයන්හි ගුරුවරුන්ගේ ඌනතා පැවැතුණි. | - එම - | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ග) | පළාත තුළ විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, සහකාර විදුහල්පති තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලය 1453 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 762 ක් වූයෙන් ඌනතාව 691 ක් විය. සෑම කලාපයකම විදුහල්පතිවරුන්ගේ ඌනතා පැවතුණි | - එම - | - එම - |

**1.5.20 ශීර්ෂය 850- ඉඩම්, පළාත් වාරි මාර්ග , කෘෂිකර්ම , සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පළාත් අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | රු.මිලියන 27.6 ක් වැයකර 2020 වර්ෂයේ වැඩ නිමකළ කරපිංච පුහුණු මධ්‍යස්ථානයේ නේවාසිකාගාරයේ සිසුන් 32 කට නවාතැන් ගතහැකි කාමර 08 පැවැතිය ද, ඉන් කාමර 04 ක් තුළ කාර්යාලය පවත්වාගෙන යන අතර ඉතිරි කාමර 04 නිශ්කාර්යව පැවතිණි. එමෙන්ම, නේවාසිකාගාරය සමඟ ඉදිකිරීමට සැලසුම් කළ දේශන ශාලාව 2023 වර්ෂය තුළ නිමකර නොතිබීම නිසා පුහුණු වැඩසටහන් පැවැත්වීම භෝජනාගාර තුළ සිදුකර තිබුණි. | 2024 සිසුන් හට නේවාසික පහසුකම් ලබා දීමට කටයුතු කරන අතර කාර්යාල ගොඩනැගිල්ලේ අළුත් වැඩියා කටයුතුද මෙම වසරේ අවසන් වීමට නියමිත බැවින් කාර්යාල සඳහා භාවිතා කරන කාමර 4 ද නැවත භාරදිය හැකිබව . | ඉදිකරන ලද ගොඩනැගිලි අරමුණ සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | වාගොල්ල පුහුණු මධ්‍යස්ථානය පිහිටි අක්කර 02 ක් පමණ වන ඉඩමේ අයිතිය පවරාගෙන නොතිබුණි. | මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් - රඹුක්කන වෙත ඉල්ලීම් සිදුකර ඇති බව. | ඉඩම් අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු ය. |

**1.5.21 ශීර්ෂය - 851 - පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | අර්ධ වාර්ෂික වාර්තාව අනුව, 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ශේෂය රු.100,960,240ක් විය. | හිඟ බදු මුදල් අයකර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු ය. |
| (ආ) | පළාත් සභාවට මිනුම් නිලධාරියෙකු නොමැති වීමෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් මිනුම් ඉල්ලීම් 137 ක් සිදුකර නොතිබුණි. | අත්‍යාවශ්‍ය මැනුම් කටයුතු ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල වෙත යොමු කරන බව. | මිනුම් නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතු ය. |

**1.5.22 ශීර්ෂය 852 - පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | මාරුක්වතුර නව ගොවිපොළ 2023 වර්ෂයේදී රු. 6,183,263 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණි. | ඉදිරියේදී මෙම ආයතනය ලාභ ලබන ආයතනයක් බවට පත්කිරීමට උපදෙස් ලබාදුන් බව . | අලාභය අවම කර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | පළාත් පුෂ්පය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කළ පැළ 3,975 කින් එක් පැලයක් හෝ රෝපණය කිරීමට නොහැකි වීමෙන් ඒ වෙනුවෙන් දරන ලද රු.945,090ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. | මෙය අසාර්ථක විය. ඉතිරි පැළ 650ක් සිංහරාජ වනය ආශ්‍රිතව රෝපණය කිරීමට කලවාන විහවි සංවිධානය වෙත භාර දී ඇති බව. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතු ය. |
| (ඇ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 25 න් 08 ක්ම අභාවිතව පැවැතිණි. | නිවාස 7ක් වාසයට නුසුදුසුය. අනෙක කිසිවෙකු ඉල්ලා නොමැත. | වත්කම් අභාවිතව නොතැබිය යුතු ය. |
| (ඈ) | වාගොල්ල ගොවිපළෙහි පිහිටා ඇති වෙළඳ සැලේ ගනුදෙනු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. 2023 වර්ෂයේ රු.4,383,142ක් වූ ආදායම හා රු.4,583,115ක වියදම දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල ද දක්වා නොතිබුණි. | මේ වන විට වාණිජ අත්තිකාරම් ගිණුම පිළියෙල කිරීම සඳහා මූලික කටයුතු සිදුකරමින් පවතී. | ගනුදෙනු විධිමත්ව සටහන් කර ආයතනයේ ප්‍රගතිය විමසිය යුතු ය. |
| (ඉ) | මහීපාල හේරත් ජන සහන පදනම වෙත 2015 වර්ෂයේ පවරා දී තිබුණු රූඩ් 03ක ඉඩම හා ගොඩනැගිල්ල 2024 පෙබරවාරි වන විටත් ආපසු පවරා ගෙන නොතිබුණි. | මෙම ඉඩම හා ගොඩනැගිල්ල පවරා දෙන ලෙස අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීම් සිදුකර ඇතිබව . | ඉඩම් හා ගොඩනැගිල්ල පවරා ගත යුතු ය. |

**1.5.23 ශීර්ෂය 853- පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ දී බිත්තර නිෂ්පාදනය සියයට 02කින් වැඩිකිරීම ආයතනයේ ඉදිරි ඉලක්කයක් ලෙස හඳුනාගෙන තිබුණද, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ බිත්තර නිෂ්පාදනය සියයට 19 කින් අඩු වී තිබුණි. | 2020 වර්ෂයේ ඇති වූ සෞඛ්‍යමය ගැටළුවලට අමතරව 2021, 2022 වර්ෂවල ආනයන කටයුතු සීමා වීම හා ගොවීන්ගේ නිෂ්පාදන අඩුවීම මීට හේතු වූ බව. | ඉලක්ක සපුරා ගැනීමට උත්සාහ කළ යුතු ය. |
| (ආ) | 2023 වර්ෂය සඳහා ඉලක්කගත ලීටර් 13,300,000ක පළාත් කිරි නිෂ්පාදනයෙන් සපුරා තිබුණේ සියයට 46 කි. එමෙන්ම, ඉලක්කගත කිරි ගොවිපොළවල් 20,000කින් 6,816ක් පමණක් ඉදිකර තිබුණු අතර කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 200 ක් පවත්වාගත යා යුතු වුවත් 104 ක් පමණක් පවත්වා තිබුණි. | රට තුළ පැවති ආර්ථික අර්බුදය මීට හේතු විය. ඉදිරියේ දී සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් ඉලක්ක සපුරා ගන්නා බව. | ඉලක්ක සපුරා ගැනීමට උත්සාහ කළ යුතු ය. |
| (ඇ) | 2023 වර්ෂය සඳහා අපේක්ෂිත අභිජනන ගොවිපොළවල් (breeder Farm) 25කින් ගොවිපොළවල් 15ක් පමණක් ඇති කර තිබුණි. | 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් නොවූ බැවින් අපේක්ෂා කළ ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බව. | ඉලක්ක සපුරා ගැනීමට උත්සාහ කළ යුතු ය. |
| (ඇ) | පේරාදෙණිය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ 2022 වර්ෂයේ පශු සම්පත් සංඛ්‍යාන අත්පොතේ වූ (LIVE STOCK STATISTICAL BULLETIN) පශු සම්පත් ගහනය සහ වාර්ෂික කිරි නිෂ්පාදනය පිළිබඳ සංඛ්‍යානමය දත්ත අනුව, සබරගමුව පළාත දිවයිනේ අවම මට්ටමේ පවතින පළාත විය. | සබරගමුව පළාත තුළ පවතින ඉඩම් සීමාව, දේශගුණය, ජනතාවගේ ආකල්ප වැනි හේතු මත මෙම තත්ත්වය උදා වුවද පශු නිශ්පාදන වැඩි කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | පශු නිශ්පාදන වර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය. |